# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,523—1958 සැප්තැම්බර් 12 වැනි සිකුරාද—12.9.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට සැලපෙන පරිද්දෙනි)



| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | — | ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 785 | මාගී කොමිටි දැන්වීම් ... — | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපණත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... — | 788 |



## අතුරු ව්‍යවස්ථා

ඇල්.ඞී.—බී. 108/50.
ඇල්. ජී. ඞී.—ජී අයි 11/20 ඇෆ්ජ්.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුවේ පල්ලේගම්පහ ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශොධිතවූ, එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්‍යාංශයේ වැඩබලන ස්ථාවර ලේකම් තැන.

1958 අගෝස්තු 29 වැනි දින,
කොළඹ.

### අතුරු ව්‍යවස්ථා

#### පොදු දැන්වීම

1. කිසිවෙකු විසින් කාර්‍යසභාවේ අණපරිදි ප්‍රදර්ශනය කර තිබෙන කිසිම දැන්වීමක් විනාශකිරීම හෝ විරූපකිරීම හෝ නොකට යුතුයි.

2. කිසිවෙකු විසින් මේ ආඥාපනතේ කිසියම් විධිවිධානයක් යටතේ හෝ එකී ආඥාපනත යටතේ සම්පාදිත කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ කාර්‍යසභාව විසින් ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් කිරීමෙදී ප්‍රධානතුමාගේ බලය යටතේ හෝ බලය පිට පිහිටුවන ලද යම් දැන්වීම් පුවරුවක්, වැටක්, කනුවක්, බාධක ලීයක් හෝ වෙනත් යම් දෙයක් ඉවත් කිරීම හෝ යම් දැන්වීමක සඳහන්කර තිබෙන නියමයක් හිතාමතාම උල්ලංඝනය කිරීම හෝ නොකට යුතුයි.

#### ගොඩනැගිලි හෝ මායිම් තාප්ප සෑදීම

3. කිසිවෙකු විසින් ගම් ප්‍රදේශය තුළ—

"ඒ" ඕනෑම ගම්බද කරත්ත පාරක් මැද සිට අඩි විස්සක දුර ප්‍රමාණයක් ඇතුළත ;

"බී" යථාකාලයේදී ගම්බද කරත්ත පාරක් බවට පත්කරනු ලැබිය හැකියයි කාර්‍ය සභාව විසින් දැනුම් දෙනු ලැබුවාවූ ඕනෑම අඩි පාරක් මැද සිට අඩි පහළවක් දුර ප්‍රමාණයක් ඇතුළත ; හෝ

"සී" "බී" ඡේදයේ සඳහන් කරන ලද අඩි පාරකින් කිසියම් බාහිර වූ ඕනෑම ගම්බද අඩි පාරක් මැද සිට අඩි දෙළහක දුර ප්‍රමාණයක් ඇතුළත හෝ යම් කිසි අලුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදීම නොකළ යුතුයි.

4. කිසිවෙකු විසින් ප්‍රධාන තුමා වෙත යටත් පිරිසෙයින් දින තිහකට කලින්වත් ලියවිල්ලකින් වූ දැන්වීමක් නොකොට 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් යම් කරත්ත පාරක් හෝ පාරක් අයිනේ කිසියම් අළුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් සෑදීම නොකළ යුතුයි.

5. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් ගම්කාර්‍යසභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ.

"කාර්‍යසභාව" යනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුවේ පල්ලේගම්පහ ගම්ප්‍රදේශයේ ගම්කාර්‍යසභාව අදහස් කරනු ලැබේ.

"ආඥාපණත" යනුවෙන් ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

9. මේ අතුරු ව්‍යවස්ථාවල—

" ප්‍රධානතුමා " යනුවෙන් කාර්‍ය්‍යසභාවේ ප්‍රධානතුමා අදහස්කරනු ලැබේ;

" කාර්‍ය්‍යසභාව " යනුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ හොරොම්බාව ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය්‍යසභාව අදහස් කරනු ලැබේ;

" ආඥපනත " යනුවෙන් ගම්සභා ආඥපනත (198 වෙනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

10. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇතැම් ගම්කාර්‍ය්‍ය සභා විසින් සම්පාදිතව 1941 ජනවාරි 24 වැනි දින අංක 8,704 දරණ ගැසට් පත්‍රයේ පළවූ රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන්වූ අතුරු ව්‍යවස්ථා අවලංගු කිරීමෙන් ඒ අතුරු ව්‍යවස්ථා හොරොම්බාව ගම්කාර්‍ය්‍ය සභාවට පමණක් අදළවන පරිද්දෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

" ඒ " උපලේඛනය

ෆෝර්මය

හොරොම්බාව ගම් ප්‍රදේශයේ ගම්කාර්‍ය්‍ය සභාව

අංකය : ———.

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවල

ප්‍රකාර සැපයියයුතු රථවාහන හා*හෝ සතුන් පිළිබඳ ලේඛනයයි

අයිතිකරුගේ නම : ———.

ඡන්ද කොට්ඨාශ අංකය : ———.

ගම : ———.

| රථවාහන හෝ*හා සතුන් පිළිබඳ විස්තර | ගණන (වචන වලින්) | වෙනත් විස්තර |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ කරත්ත හැර ඕනෑම අන්දමක වාහන ... | | |
| ඕනෑම අන්දමකු ගොන් දෙන්නා බඳින බර කරත්ත හෝ තිරික්කල ... ... | | |
| තනිගොනා බඳින බර කරත්ත හෝ තිරික්කල | | |
| අත් කරත්ත ... ... | | |
| ජින් රික්ෂෝ කරත්ත ... ... | | |
| බයිසිකල් (වෙනත් විස්තර සඳහා සපයා ඇති තීරයේ සාදන ලද අයගේ අංකය සඳහන් කරනු) ... ... ... | | |
| අලි ... ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| අශ්වතරයෝ ... ... | | |
| බූරුවෝ ... ... ... | | |

* නුවුවමනා වචන කපා දමනු

ඉහත සඳහන් විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් මම මෙයින් ප්‍රකාශ කරමි.

දිනය : ———.

———,
අයිතිකරුගේ අත්සන

" බී " උපලේඛනය

කරත්ත, තිරික්කල හෝ ජින් රික්ෂෝ කරත්ත හැර ඕනෑම අන්දමක වාහන ... ... හො.ග.ස.ර.
ඕනෑම අන්දමක සෑම ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... හො.ග.ස.බ.ක.
සෑම තනි ගොනා බඳින කරත්තයක් සඳහා ... හො.ග.ස.බ.බ.ක.
සෑම බයිසිකලයක් සඳහා ... ... හො.ග.ස.බ.
සෑම අත් කරත්තයක් සඳහා ... ... හො.ග.ස.අ.ක.
සෑම ජින් රික්ෂෝ කරත්තයක් සඳහා ... හො.ග.ස.රි.ක.

# විවිධ දැන්වීම්

## උඩුනුවර කඳුපළාත ගම්කාර්‍ය්‍ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත උප ලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානවල 1958 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍ර ඉල්ලා අයදුම් පත් මා වෙත එවා තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ " 201 වැනි පරිච්ඡේදයේ " 1947 අංක 44 දරණ සංශෝධිත ආඥපනතේ 6 වැනි වගන්තියෙන් සංශෝධනය කරනලද 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. එකී බලපත්‍ර නිකුත්කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර කඳුපළාත ගම්කාර්‍ය්‍යසභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේ නම් ඔහු හෝ ඇ එසේ විරුද්ධ වන්නේ කුමන හේතුන් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපතක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දහහතර දිනක් ඇතුළත මා වෙත එවියයුතු බව මෙයින් දන්වා සිටිමි.

උපලේඛනය

| | ඉල්ලුම්කරුගේ නම | ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|---|
| (1) | මූසා බෙබේ සේගු ලෙබ්බෙ | වෙළම්බොඩ | වෙළම්බඩ රත්තේ කොස්ගහමූල වත්තේ කඩේ | හරක්මස් |
| (2) | ඇම්. ඒ. හබීබ් ලෙබ්බෙ | වටදෙනිය, වෙළම්බොඩ | වටදෙනියේ අටලහ තැන්න | හරක්මස් |
| (3) | ඊ. ඇම්. රෂීඩ් ... | වටදෙනිය, වෙළම්බොඩ | වෙළම්බොඩ වැලි හුන්න නොහොත් දළුක්කොටුවේවත්ත | හරක්මස් |
| (4) | ඇම්. ඇල්. ඇම්. වහාබ් | වෙළම්බොඩ | වෙළම්බොඩ පල්ලිය පැලේ ගේ | හරක්මස් |
| (5) | ඇයි. ඇල්. ඇම්. ලෙබ්බෙ | වෙළම්බොඩ | වෙළම්බොඩ ගල්මුල් ලේවත්තේ කඩේ | හරක්මස් |
| (6) | ඇම්. ජුනයිදීන් | වෙළම්බොඩ | වෙළම්බොඩ පතහ දෙනියවත්ත | හරක් මස් හා එළු මස් |
| (7) | ඇම්. යූ. මුහම්මද් සාලි | වටදෙනිය, වෙළම්බොඩ | වටදෙනිය, අවලහ තැන්න | හරක්මස් |
| (8) | ඊනා අසන් ලෙබ්බෙ | වටදෙනිය, වෙළම්බොඩ | වටදෙනිය, අවලහ තැන්න කඩේ | හරක්මස් |
| (9) | ටී. ඒ. හමීඩ් ... | කුරුකුත්තල, කඩුගන්නාව | කුරුකුත්තල ගල් පිහිල්ල වත්තේකඩේ | හරක්මස් |
| (10) | එම්. ඇස්. අබුල් හසන් | වටදෙනිය, වෙළම්බොඩ | වටදෙනිය අවලහ තැන්නේ කලල්පිටිය වත්තේ ගේ | හරක්මස් |
| (11) | ටී. අබ්දුල් කාදර් | කුරුකුත්තල, කඩුගන්නාව | ලගමුව කුරුකුත්තලට හැරෙන පාරේ හන්දිය | හරක්මස් හා එළු මස් |

යූ. ඇල්. නූර්මොහමඩ්,
ගම්කාර්‍ය්‍යසභාවේ සභාපතිතැන.

1958.8.29,
උඩුනුවර කඳුපළාත ගම්සභා කාර්‍ය්‍යාලය,
වෙළම්බොඩ

## විශේෂ නිවේදනයයි

1958 සැප්තැම්බර් මස 26 වැනි සිකුරාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, සැප්තැම්බර් මස හතර වැනි සතියේ ගැසට් පත්‍රය 1958 සැප්තැම්බර් මස 25 වැනි බ්‍රහස්පතින්ද නිකුත් කරනු ලැබේ. ඒ හෙයින් එහි පළකිරීම සඳහා එවන නිවේදන සහ දැන්වීම් සැප්තැම්බර් මස 22 වැනි සඳුද පස්වරු 4 ට පෙර මෙම කාර්‍ය්‍යාලයට ලැබෙන සේ එවිය යුතු බව කාගේත් දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

1958 සැප්තැම්බර් 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ 8.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.